# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

ඩී. එස්. ෆොන්සේකා පාර, කොළඹ 05, ශ්‍රී ලංකා.

දුරකථන / ෆැක්ස් : 2556629   වෙබ් අඩවිය : www.slpia.lk   ඊ-මේල් : slpia@sltnet.lk

මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/බැහැර/11/21   ඔබේ අංකය :

2021.01.22

රියර් අද්මිරාල් ආචාර්ය සරත් වීරසේකර මැතිතුමා,
ගරු මහජන ආරක්ෂක අමාත්‍ය,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
සුහුරුපාය,
බත්තරමුල්ල.

**<u>පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ නිලධරයන්ගේ වෘත්තීමය භාවය ඉහල නැංවීම.</u>**

පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ නිලධරයන්ගේ ගැටළු සම්බන්දව සොයා බැලීම සඳහා ඔබතුමා සෘජුව මැදිහත් වී කටයුතු කිරීම සම්බන්ධව සහ එකී ගැටළු වැඩිදුරටත් සාකච්ඡා කිරීම සඳහා අප සංගමයේ ඉල්ලීම පරිදි අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඉතා කෘතඥ පූර්වක ස්තුතිය පුදකරන්නෙමු.

පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ නිලධරයන් දීර්ඝ කාලයක් තිස්සේ අත්විඳිනු ලබන ගැටළු සහ ඔවුන්ගේ වෘත්තීමය භාවය ඉහල නැංවීම සඳහා අපගේ යෝජනාවලිය පහත පරිදි ඉදිරිපත් කරන්නෙමු.

**01.එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා යෙදවීම.**

මේ සම්බන්ධව ව්‍යවස්ථා දායක සභාව වෙත යොමුකරන ලද ලිපි කට්ටලයේ පිටපතක් **ඇමුණුම 01** ලෙස යා කර ඇත.

එමෙන්ම එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා නිළධාරීන් නම් කිරීමේදී නිසි ක්‍රමවේදයක් නොමැති වීම.

**02. උසස් අධ්‍යාපන අවස්ථා සැලසීම.**

පරීක්ෂක ශ්‍රේණියේ නිලධරයන් වෙත දේශීය විශ්ව විද්‍යාලයන්හි උපාධි, පශ්චාත් උපාධි ලබා දීම සඳහා අවස්ථාව ලැබෙනමුත්, විදේශ විශ්ව විද්‍යාලයන්හි උපාධි සහ පශ්චාත් උපාධි මෙන්ම උසස් ඩිප්ලෝමා හැදෑරීම සඳහා ලැබෙන අවස්ථා අතිශයින් අවම වී ඇත.

එබැවින් පොලිස් රාජකාරියට අදාල විෂයධාරා යටතේ උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා වැඩි වශයෙන් පරීක්ෂක ශ්‍රේණියේ නිලධරයන් හට අවස්ථාව ලබා දීම.

**03.පරීක්ෂක ශ්‍රේණියේ උපාධිධාරී නිලධරයන්.**

ශ්‍රී ලංකා පොලිසියේ 2019 වර්ෂය වන විට (පොලිස් පර්යේෂණ හා සැලසුම් කොට්ඨාශය විසින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වූ) පරීක්ෂක ශ්‍රේණියේ උපාධිධාරී නිලධරයන් 360 කට ආසන්න ප්‍රමාණයක් සිටින අතර, ඔවුන් පහත විෂය ධාරාවන් යටතේ උපාධි හිමිකරගෙන ඇත. නිලධරයන්ගේ නාමලේඛණය **ඇමුණුම 02** වශයෙන් යාකර ඇත.

- නීතීඥ වරුන් (නීතිවේදී උපාධිය සහිතව) - 11
- නීතිවේදී උපාධිධාරීන් (නීතීඥවරුන් නොවන) - 11
- කලා විෂය ධාරාව (ලලිත කලා උපාධියද ඇතුළුව) - 171
- වාණිජ ගිණුම් කරණය. - 12
- විද්‍යා. - 35
- වෙනත්. - 120
- එකතුව - 360

ඉහත උපාධිධාරී නිලධාරීන් අතුරින් සාතිශය බහුතරයක් හට ඔවුන් විසින් හදාරන ලද විෂයධාරාවන්ට සරිලන පරිදි රාජකාරී ව්‍යුහයක් ලැබී නොමැත. එම නිලධාරීන්ගේ විෂයානුබද්ධ හා ප්‍රායෝගික දැනුම ඵලදායිලෙස යොදා ගැනීම සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීම.

එමෙන්ම එම උපාධිධාරී නිලධාරින් ඇගයීම සඳහා හා අනෙකුත් නිලධරයන් උසස් අධ්‍යාපනය සඳහා යොමුවීම දිරිගැන්වීම සඳහා සුදුසු උපාධිධාරී විශේෂ දීමනාවක් ලබා දීම සහ නීතීඥවරුන් වශයෙන් දිවුරුම් දී ඇති පරීක්ෂක ශ්‍රේණියේ නිලධරයන් සේවය තුල රඳවා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සැකසීම.

**04. උප පොලිස් පරීක්ෂක තනතුරේ සිට පොලිස් පරීක්ෂක තනතුර දක්වා උසස්වීම්.**

2011 වර්ෂයේ සේවයට එක්වූ උප පොලිස් පරීක්ෂක නිලධාරීන් 164 ක් හා 2012 වර්ෂයේ සේවයට එක්වූ ද්‍රවිඩ මාධ්‍ය උප පොලිස් පරීක්ෂක නිලධාරීන් 44 ක් හා කාන්තා උප පොලිස් පරීක්ෂක නිලධාරිණියන් 112 ක් ද සිටින අතර, මෙම නිලධරයන් පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීම සඳහා සැපිරිය යුතු උපරිම සේවා කාලය ද අවසන් කර ඇත.

මෙම නිලධරයන් පොලිස් පරීක්ෂක තනතුරට උසස් කිරීම මගින් රජය විසින් ගෙවීමට සිදුවන වැටුප් හා දීමනා වල විශාල වෙනසක් සිදු නොවන බැවින්, ඒ සඳහා රජයට විශාල වැය බරක් දැරීමට සිදු නොවන බවද දන්වා සිටිමු.

**05. සහකාර පොලිස් අධිකාරී තනතුර සඳහා උසස් කිරීම.**

ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරේ සිට සහකාර පොලිස් අධිකාරී තනතුරට උසස් කිරීම සඳහා දැනට අනුමත බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටිය (SOR) අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සඳහා අයදුම්පත් කැඳවා ඇත. දැනට සහකාර පොලිස් අධිකාරී තනතුරේ නිලධාරීන් 196 පමණ සිටින අතර, එම නිලධාරීන් 2018 වර්ෂයේ එම තනතුරට උසස්වීම් ලබා ඇත.

ඉහතින් සඳහන් කරන ලද සහකාර පොලිස් අධිකාරී නිලධාරීන් 196 අතුරින් තිදෙනෙකු AAT/44/2017(NPC) දරන අභියාචනය යටතේ අභියාචනා විනිශ්චය සභාව වෙත අභියාචනය කිරීමෙන් අනතුරුව පළමු සහ දෙවැනි අභියාචක වරුන්ගේ උසස්වීමේ දිනය 2014.01.13 දිනට පෙරදාතම කිරීමටත්, තුන්වන අභියාචක පෙරකී දිනයටම පෙරදාතම කර, ඔහුට එරෙහිව නිකුත්කරන ලද විනය තීන්දුවක් සම්බන්ධව අභියාචනයක් පැවැත්වෙන බැවින් ඔහුව පොරොත්තුලේඛණ ගත කිරීමටත් තීන්දුවක් ලබා දී ඇත. එම නඩු තීන්දුවේ කරුණු සළකා බැලීමේදී 2018.07.10 දිනට උසස්වීම් ලද ඉතිරි සහකාර පොලිස් අධිකාරී නිලධරයන් සියළු දෙනා සුදුසුකම් සපුරාලන බැවින්, එම නිලධාරීන්ද ඉහත කී දිනයට පෙරදාතම කිරීමට සිදුවනු ඇත. **(ඇමුණුම 03)**

දැනට අනුමත සහකාර පොලිස් අධිකාරී සංඛ්‍යාව 314ක් වන අතර, ඉහත පරිදි නඩු තීන්දුව මගින් උසස්වීම් දිනය 2014 දක්වා පෙරදාතම කිරීම හේතුවෙන් දැනට සිටින සියළුම සහකාර පොලිස් අධිකාරී වරුන් පොලිස් අධිකාරී තනතුරට උසස්වීම් ලබන අතර, පුහුණුව ලබන ආධුනික සහකාර පොලිස් අධිකාරීවරුන් 14 දෙනෙකු පමණක් ඉතිරිවනු ඇත. එමගින් නව පුරප්පාඩු 300 ක් නිර්මාණය වන අතර, එම පුරප්පාඩු සඳහා දැනට සේවයේ යෙදී සිටින පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන් තුලින් එම පුරප්පාඩු පිරවීම සඳහා උසස්වීම් ලබා දීමට හැකියාව ඇත.

එමෙන්ම දැනට සහකාර පොලිස් අධිකාරී තනතුරේ සහ පොලිස් අධිකාරී තනතුරේ සේවයේ යෙදී සිටින නිලධාරීන් 109 දෙනෙකු පමණ 2023 වන විට විශ්‍රාම යාමට නියමිතය. ඒ තුලින්ද එම තනතුරු සඳහා නැවත පුරප්පාඩු නිර්මාණය වන අතරම, 2023 වන විටද මෙවර සුදුසුකම් ලැබූ ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලධාරීන් හැර සුදුසුකම් ලබන වෙනත් අයදුම්කරුවන්ද නැත. එබැවින් එම පුරප්පාඩු සංඛ්‍යාව අද දිනට සලකා බලා පුරප්පාඩු පිරවීම සඳහා පරීක්ෂක නිලධාරීන් හට සහකාර පොලිස් අධිකාරී තනතුරට උසස්වීම් ලබා දීමට යෝජනා කරමු. දත්තයන් ඇතුලත් වගුව **ඇමුණුම 04** ලෙස යාකර ඇත.

**06. සහකාර පොලිස් අධිකාරී තනතුර සඳහා අනුමත පුරප්පාඩු සංඛ්‍යාව වැඩිකර ගැනීම.**

උගත් පාඩම් හා ප්‍රතිසංවිධාන කොමිෂන් සභා වාර්තාව විසින් කරන ලද නිර්දේශ ප්‍රකාරව සහ වරින් වර එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ශ්‍රී ලංකාව සම්බන්ධව නිකුත්කරන ලද වාර්තා අනුව පහත ක්ෂේත්‍රයන් සම්බන්ධ වැඩිදුර අවධානය යොමුකරන ලෙසට නිර්දේශ කර ඇත.

අ). මානව හිමිකම්.
ආ). ළමා හා කාන්තා අයිතීන් ආරක්ෂණය.
ඇ). අපරාධ පාලනය.
ඈ). මාරක රිය අනතුරු හා මාර්ග ආරක්ෂාව.
ඉ). පරිසර ආරක්ෂණය.
ඊ). මහජන සම්බන්ධතා.

ඉහත වාර්තා සහ නිර්දේශ පරිශීලනය කිරීමේදී එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පොලිස් කොට්ඨාශ මට්ටමින් ඊට වගකිවයුතු සහකාර පොලිස් අධිකාරී වරයෙකු පහත ක්ෂේත්‍රයන් යටතේ පත් කිරීමේ අවශ්‍යතාවය පැනනැගී ඇත.

i. සහකාර පොලිස් අධිකාරී නීති, මානව හිමිකම් සහ ළමා හා කාන්තා ආරක්ෂණය.
ii. සහකාර පොලිස් අධිකාරී අපරාධ සහ රථවාහන.
iii. සහකාර පොලිස් අධිකාරී පරිසර ආරක්ෂණ සහ මහජන සම්බන්ධතා.

ඉහත සඳහන් කරන ලද සහකාර පොලිස් අධිකාරී "නීති, මානව හිමිකම් සහ ළමා හා කාන්තා ආරක්ෂණය ", සහකාර පොලිස් අධිකාරී "අපරාධ සහ රථවාහන" හා සහකාර පොලිස් අධිකාරී "පරිසර ආරක්ෂණ සහ මහජන සම්බන්ධතා" වශයෙන් ප්‍රාදේශීය කොට්ඨාශ 44 සඳහා සහකාර පොලිස් අධිකාරී තනතුරු 132 ක් සහ ක්‍රියාකාරී කොට්ඨාශ තුලින් විමර්ශන කටයුතු සිදු කෙරෙන සහ මහජනයා සම්බන්ධව සෘජුවම සම්බන්ධවී කටයුතු කරනු ලබන ක්‍රියාකාරී කොට්ඨාශයන් සඳහා සහකාර පොලිස් අධිකාරී නීති, මානව හිමිකම්, ළමා හා කාන්තා අයිතීන් ආරක්ෂණ සහ මහජන සම්බන්ධතා වශයෙන් සහකාර පොලිස් අධිකාරී තනතුරු 21 ක්, එනම් නව තනතුරු 153 ක් නිර්මාණය කිරීම.

එමෙන්ම ඇතැම් පොලිස් කොට්ඨාශවල පොලිස් ස්ථාන අධික සංඛ්‍යාවක් ඇති අතර, දැනට බොහෝ කොට්ඨාශවල සිටින්නේ සහකාර පොලිස් අධිකාරී දිස්ත්‍රික් 03 ක් හෝ 04 ක් පමණි. එබැවින් සහකාර පොලිස් අධිකාරී තනතුරු ඉහළ නැංවීමේදී පරිපාලන ගැටළු ඇති නොවන බව අප තවදුරටත් නිරීක්ෂණය කරන්නෙමු.

**07. පොලිස් පරීක්ෂක සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලධාරීන් වෙත රාජ්‍ය නිවේදිත නිල තත්ත්වය ලබා ගැනීම.**

1973 සැප්තැම්බර් මස 19 දින අංක 70 දරන ශ්‍රී ලංකා පොලිස් ගැසට් පත්‍රය අනුව පොලිස් සේවයේ හා සන්නද්ධ සේවාවල අනුරූප තනතුරු සමීකරණය යටතේ "පොලිස් පරීක්ෂකවරුන් හා පොලිස් ස්ථාන භාර උප පරීක්ෂක වරුන් දැන් රාජ්‍ය නිවේදිත නිලධාරීන් වශයෙන් සලකන බවද, ඒ නිසා ඔවුන් සන්නද්ධ හමුදාවල පහළ ශ්‍රේණියේ අධිකාරි බලය ලත් නිලධාරින් හට සමාන තත්ත්වයක් දරන බවත් දක්වනු කැමැත්තෙමි" යනුවෙන් සඳහන්ව ඇත. (එම ගැසට් පත්‍රයේ පිටපතක් ඇමුණුම 05 ලෙස යාකර ඇත.)

සියළුම පරික්ෂකවරුන් සහ ස්ථානභාර උප පරික්ෂකවරුන් රාජ්‍ය නිවේදිත තත්වයේ ලා සැලකිය යුතු බව සඳහන් කර ඇතිමුත් එම ගැසට් පත්‍රය නිත්‍යානුකූලව අවලංගු වි නොමැති මුත් කාලයගේ ඇවෑමෙන් ඒ සම්බන්ධයෙන් වූ අවධානය ගිලිහී ඇත. එබැවින් පරික්ෂක ශ්‍රේණියේ නිලධාරින් හට රාජ්‍ය නිවේදිත තත්වය ලබා දිමට කටයුතු කිරිම සුදුසු බව යෝජනා කරමු.

**08. ස්ථානභාර නිලධාරීන් පත් කිරීම.**

ශ්‍රී ලංකා පොලිසිය තුල ස්ථානභාර නිලධාරීන් පත්කිරීම සඳහා ස්ථිර විනිවිද භාවයක් නොමැති වීම මත විටින් විට වෙනස් වීම් වලට ලක්වන ක්‍රමවේද අනුගමය කිරීම තුල දක්ෂ, අත්දැකීම් බහුල නිලධාරීන් වෙත අවස්ථාව අහිමි වීම පිළිබඳව නිරන්තරයෙන්ම අප සංගමය තුල සාකච්ඡාවට බඳුන් වී ඇත.

ස්ථානභාර නිලධාරීන් ලෙස රාජකාරි කිරීමට අපේක්ෂිත පරීක්ෂක වරුන් සහ වරියන් සම්මුඛ පරීක්ෂණයකට යොමුකර නිසි ඇගයීමකට ලක්කිරීමෙන් පසු තනතුරු ලබා දීම සුදුසු බව යෝජනා කරමු.

**09. තනිකඩ හට නිවාස සහ විවාහක නිල නිවාස.**

පරීක්ෂක ශ්‍රේණියේ නිලධරයන් සඳහා සුදුසු හා ප්‍රමාණවත් පහසුකම් වලින් යුත් නිල නිවාස අවම ප්‍රමාණයක පවතින බැවින්, ස්ථානවලට අනුයුක්ත අවිවාහක පරීක්ෂක ශ්‍රේණියේ නිලධරයන් සහ විවාහක නිලධරයන් විවිධ අපහසුතාවලට ලක්වන බවට නිරන්තරයෙන් අප සංගමය වෙත සාමාජිකයින් වාර්තා කර ඇත.

පොලිස් ස්ථාන මට්ටමින් ඇති පරීක්ෂක ශ්‍රේණියේ තනිකඩ හට නිවාස සහ විවාහක නිල නිවාස තනතුරේ අභිමානය ආරක්ෂා වන මට්ටමින් පවත්වාගෙන යා හැකි ලෙස සකස් කර ගැනීමට සහා නව නිල නිවාස ඉදිකිරීමට කඩිනමින් කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරන්නෙමු. එසේ නව නිල නිවාස ඉදිකරන තෙක් තාවකාලික විසඳුමක් ලෙස වත්මන් ආර්ථිකයට ගැලපෙන පරිදි ගෙවල් කුලී දීමනාවක් ලබා දීම සඳහා වැඩිදුරටත් යෝජනා කරන්නෙමු.

## 10. නීතිඥවරු 150 ක් ප්‍රධාන පොලිස් පරික්ෂකවරු ලෙස බඳවා ගැනීම

ඉහත ජේද 03 හි සඳහන් කල පරිදි පොලිස් පරික්ෂක ශ්‍රේණියේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ දිව්රුම් දුන් නීතිඥවරුන් 15 දෙනෙකු මේ වන විට සේවයේ නියුතු අතර, එම නිළධාරින් නිසි පරිදි කළමණාකරණය කර ඔවුන්ගෙන් අපේක්ෂිත අරමුණු ඉටුකරගත හැකි බව කාරුණිකව දන්වා සිටිමි. තව දුරටත් මෙම නිළධරයන් වසර 10 සිට වසර 25 දක්වා පරික්ෂක ශ්‍රේණියේ සේවා කාලයක් සපුරා ඇති, අපරාධ විමර්ෂණය, අධිකරණයේ නඩු මෙහෙයවීම සහ පොලිස් පරිපාලනය සම්බන්ධ හසල අත්දැකීම් ඇති නිළධරයන්බව කාරුණිකව සිහිපත් කරමු. (පොලිස් පරීක්‍ෂක ශ්‍රේණියේ නීතිඥ වරුන් වන නිලධාරීන් සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපි හා නිලධරයන්ගේ නාමලේඛණය **ඇමුණුම 06** වශයෙන් යාකර ඇත.)

## 11. සහකාර පොලිස් අධිකාරී තනතුර සඳහා ඉඳුරාම බඳවා ගැනීම සම්බන්ධව.

සහකාර පොලිස් අධිකාරී තනතුර සඳහා ඉඳුරාම බඳවා ගැනීමේදී මූලික අධ්‍යාපන සුදුසුකමක් ලෙස සලකා බලන්නේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක් මගින් උපාධියක් ලබා ගැනීම පමණක් වන අතර, ඒ අනුව විවිධ විෂයධාරාවන් තුලින් මූලික උපාධි ලබාගත් පුරවැසියන් මේ සඳහා සුදුසුකම් ලබයි. නමුත් ශ්‍රී ලංකා පොලිසිය වැනි නීතිය හා සාමය පවත්වාගෙන යාම හා සුරැකීම සිදුකරනු ලබන ආයතනයක් සඳහා එම ක්ෂේත්‍රයට අදාල විෂයධාරාවන් තුලින් අධ්‍යාපනය ලබා උපාධි හිමි කරගත් පුද්ගලයන් බඳවා ගැනීම අත්‍යවශ්‍ය කාරණයක් බව අප නිරීක්‍ෂණය කරමු.

මීට ඉතා ඵලදායි විකල්පයක් ලෙස දැනට ත්‍රිවිධ හමුදාවේ ක්‍රියාත්මක නිලධාරීන් බඳවා ගැනීමේ ක්‍රමවේදය, එනම් සියළුම නිලධාරීන් (වෘත්තිකයන් හැරුණුකොට) උප පොලිස් පරීක්‍ෂක තනතුරට බඳවා ගැනීමෙන් අනතුරුව එම නිලධරයන් හට ශ්‍රී ලංකා පොලිස් විශ්ව විද්‍යාලය (දැනට ස්ථාපිත වෙමින් පවතින), කොතලාවල ආරක්‍ෂක විශ්ව විද්‍යාලය හෝ රජයේ විශ්ව විද්‍යාලයක් මගින් උපාධියක් ලබා ගැනීමට අවස්ථාව හිමිකර දී එම නිලධාරීන් ක්ෂේත්‍රයේ රාජකාරී සඳහා යොදවා අපරාධ විමර්ශනය; අධිකරණ රාජකාරී සහ පොලිස් පරිපාලනය සම්බන්ධව අත්දැකීම් සහ අවබෝධයක් ලබා දී ඔවුන් අතුරින් තරග විභාගයක් තුලින් සමත්වන නිලධරයන් සහකාර පොලිස් අධිකාරී තනතුර සඳහා ඉඳුරා බඳවා ගැනීම සඳහා අප යෝජනාකර සිටිමු.

මේ සම්බන්ධව අප අතිගරු ජනාධිපතිතුමා දැනුවත් කරන ලද අතර, එතුමාද මෙම යෝජනාව සඳහා එකගවූ අතර, ඉතා ධනාත්මකව ප්‍රතිචාර දක්වන ලදි.

**12. උප පොලිස් පරීක්ෂක තනතුරට බඳවා ගැනීම් සහ උසස්කිරීමේ පටිපාටිය (SOR) සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම.**

සහකාර පොලිස් අධිකාරී තනතුරට බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටියට අනුව (SOR) සහකාර පොලිස් අධිකාරී තනතුරෙන් ඉහල නිලධරයන් විශ්‍රාම යාමේදී ඔවුන් ඊළග තනතුර සඳහා උසස්වීමට අවශ්‍ය අවම සුදුසුකම් සපුරා තිබේනම් විශ්‍රාම යාමේදී ඊළග තනතුරට උසස් කිරීමට ප්‍රතිපාදන ඉහත අනුමත පටිපාටියේ ඇතුලත් කර ඇත.

එසේ වුවද, දැනට කෙටුම්පත් කර ඇති උප පොලිස් පරීක්ෂක තනතුරට බඳවා ගැනීම් සහ උසස් කිරීම් පරිපාටියට එවැනි ප්‍රතිපාදනයක් ඇතුලත් කර නොමැත. එබැවින් ඉහත පූර්වාදර්ශය අනුගමනය කරමින් සෙසු තනතුරු වල නිලධරයන් ද සේවයෙන් විශ්‍රාම ගැනීමට පෙර එම තනතුරේ සිට ඊලග තනතුරට උසස්වීම සඳහා අවශ්‍ය අවම සුදුසු කම් සපුරා තිබේනම්, එම නිලධරයන් ද විශ්‍රාම ගැනීමට පෙර ඊලග තනතුරට උසස් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන උප පොලිස් පරීක්ෂක බඳවා ගැනීම් හා උසස් කිරීම් පටිපාටියට (SOR) ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් යෝජනා කර සිටින්නෙමු. (මේ සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත හා පොලිස්පතිතුමා වෙත ඉදිරිපත් කරන ලද ලිපිවල පිටපත් **ඇමුණුම 07** ලෙස යාකර ඇත.)

සමස්ථ රටවැසියන් වෙත වඩාත් කාර්යක්‍ෂම සේවාවක් ලබා දීම සඳහා ඉහත අප සංගමයේ යෝජනාවන් පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමුකර ශ්‍රී ලංකා පොලිසිය තුල පරීක්ෂකවරුන්ගේ වෘත්තීමය මට්ටම ඉහල නැංවීම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටින්නෙමු.

ශ්‍රී ලංකා පොලිස් පරික්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

එස්. සංජය පෙරේරා,
නීතිවේදී,
ප්‍රධාන පොලිස් පරීක්ෂක,
සභාපති,
පොලිස් පරික්ෂක වරුන්ගේ සංගමය.

ගරු සභාපති
පොලිස් පරීක්ෂක සංගමය

නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි,
ආචාර්ය උපාධි අපේක්ෂක,
නීතිවේදී (ගෞරව),
පොලිස් පරික්ෂක,
ලේකම්,
පොලිස් පරික්ෂක වරුන්ගේ සංගමය

නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි
නීතිවේදී (ගෞරව)
ගරු ලේකම්,
ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය